# සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය
# තනතුරු පුරප්පාඩු

කෘෂිකාර්මික, තොග හා සිල්ලර වෙළඳාම, ආනයන හා අපනයන හා නියෝජිත සේවා කටයුතු වල නිරත වූ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුළුල් සම්බන්ධතාවයක් සහිත දිවයිනේ ප්‍රධානතම සමුපකාර සංවිධානයක් වූ මෙම සංගමයේ පහත පුරප්පාඩු තනතුරු සඳහා සුදුසුකම් ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තනතුර - සාමාන්‍යාධිකාරී
වැටුප් පරිමාණය - 65,200 - 10x1,500

<u>අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්</u>

i. පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ හා කෘෂිකාර්මික යන විෂයයන් එකක් හෝ ඇතුලත් වන පරිදි පශ්චාත් උපාධියක් සමග පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 05ක පළපුරුද්ද. හෝ,

ii. පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ නීතිය හා කෘෂිකර්මය යන විෂයයන් එකක් හෝ ඇතුලත් වන පරිදි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමත්වීම සමග පිළිගත් ආයතනයක විධායක මට්ටමේ වසර 06ක පළපුරුද්ද. හෝ,

iii. පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ හා කෘෂිකර්මය යන විෂයයන් එකක් හෝ ඇතුලත් වන පරිදි උපාධිය සමග පිළිගත් ආයතනයක විධායක මට්ටමේ වසර 07ක පළපුරුද්ද.

ඉහත තනතුර සඳහා රු. 100,000/- පමණ දළ වැටුපක් හිමිවන අතර තවදුරටත් පළපුරුද්ද අනුව මෙම වැටුප සාකච්ඡා කර තීරණය කරගත හැක.

02. තනතුර - කළමණාකරු අලෙවි
වැටුප් පරිමාණය - 56,200 - 10x900

<u>අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්</u>

i. පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ හා කෘෂිකර්මය යන විෂයයන් එකක් හෝ ඇතුලත් වන පරිදි උපාධිය සමග විධායක මට්ටමේ වසර 03ක පළපුරුද්ද. හෝ,

ii. අ.පො.ස. උ/පෙ සාමාර්ථය සමග පිළිගත් ආයතනයකින් වාණිජ, කළමනාකරණ, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, මානව සම්පත් කළමනාකරණ හා කෘෂිකර්මය යන විෂයයන් එකක් හෝ ඇතුලත් වන පරිදි වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමග අදාල ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 05ක පළපුරුද්ද.

ඉහත තනතුර සඳහා රු. 85,000/- පමණ දළ වැටුපක් හිමිවන අතර තවදුරටත් පළපුරුද්ද අනුව මෙම වැටුප සාකච්ඡා කර තීරණය කරගත හැක.

තවද, අයදුම්කරුවන්ගේ අවම වයස අවුරුදු 18 නොඅඩුවිය යුතු අතර උපරිම වයස අවුරුදු 45ට නොවැඩිවිය යුතුය. තවද ඉහත තනතුරු සඳහා සේ.අ.අ./සේ.භා.අ. වෙනුවෙන් දායකත්වයක් ලබාදෙන අතර, වර්ෂ අවසානයේ ප්‍රසාද දීමනා හා වෙනත් දීමනා සඳහාද හිමිකම් ලබනු ඇත.

ඉහත සුදුසුකම් සපුරා ඇති අයවලුන් තමන් විසින් සකස් කර ගන්නා ලද අයදුම්පතක් මගින් සියලු විස්තර සඳහන් කර උප්පැන්න අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතික වල ඡායා පිටපතක් සමග සිය අයදුම්පත් 2026.07.16 දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට ඉදිරිපත් කල යුතුය.

සභාපති,
සීමාසහිත ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය,
අංක: 127, ග්‍රෑන්ඩ්පාස් පාර,
කොළඹ 14.